ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

1574

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව - I | 85 | S | I | කාලය: පැය 01 යි. |
|---|---|---|---|---|---|

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. $C_{12}H_{22}O_{11}$ අනුක සූත්‍රයට ආහාර වර්ගය වනුයේ,
(1) තිරිඟු (2) ඉදුණු පළතුරු (3) මී පැණි (4) පිකුදු

02. ඔමේගා 3 මේද අම්ලය වැඩිපුර අඩංගු වන්නේ,
(1) පිකුදුවල ය. (2) බිත්තරවල ය.
(3) මාළු අක්මා තෙල්වල ය. (4) සත්ව කිරිවලය.

03. අයඩීන්වල ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) මොළය අස්ථි, සම හා හිසකෙස් වර්ධනයට
(2) පරිවෘත්තීය සීඝ්‍රතාවය පාලනය කිරීමට
(3) මව්කිරි ස්‍රාවය කිරීමට උත්තේජනය කිරීම.
(4) ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කිරීම.

04. විටමින් B කාණ්ඩයට අයත් සයනොකොබැලමින් අඩංගු ආහාර වන්නේ,
(1) කිරි, පිකුදු, කුකුල්මස්, ඉස්සන්ය. (2) කව්පි, මෑ, සෝයා, පරිප්පු ය.
(3) මුංඇට, ඉස්සන් කිරි, කඩල ය. (4) පිකුදු, කුකුල්මස්, මුංඇට, පරිප්පු ය.

05. මස් හා කිරිවල අඩංගු ප්‍රෝටීන් පිළිවෙළින් දැක්වෙන කාණ්ඩය වනුයේ,
(1) ඇක්ටින් හා කේසීන්ය. (2) ඉලාස්ටින් හා කේසීන් ය.
(3) මයොසින් හා ලෙගියුමින් ය. (4) සෙයින් හා ග්ලූටනින් ය.

06. ආහාරයක කාබෝහයිඩ්‍රේට 12g ද ප්‍රෝටීන් 10g හා මේද 10g ඇත. එයින් ලැබෙන ශක්ති ප්‍රමාණය වනුයේ, කිලෝ කැලරි,
(1) 120 කි. (2) 150 කි. (3) 178 කි. (4) 212 කි.

07. විටමින් $B_6$ ලෙස හඳුන්වන්නේ,
(1) නයසීන් ය. (2) පිරිඩොක්සින් ය.
(3) රයිබෝප්ලෙවින් ය. (4) තයමින් ය.

08. මස් හා මාළු ගබඩාකර තැබීම සඳහා සුදුසු උෂ්ණත්වය වන්නේ,
(1) $4^0C$ - $8^0C$ උෂ්ණත්වයේය. (2) $7^0C$ - $10^0C$ උෂ්ණත්වයේය.
(3) - $8^0C$ හෝ ඊට අඩු උෂ්ණත්වයේය. (4) - $20^0C$ හෝ ඊට වැඩි උෂ්ණත්වයේය.

09. නිර්දේශිත දෛනිය අවශ්‍යතා සටහනට (RDA) අනුව නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) යොවුන් වියේ පසුවන ගැහැණු හා පිරිමි දරුවන් සඳහා ශක්ති අවශ්‍යතාවය සමාන වේ.
(2) යොවුන් වියේ දී වයසින් වැඩෙත්ම කැල්සියම් අවශ්‍යතාවය වැඩි වේ.
(3) පුද්ගලයෙකු යෙදෙන ස්වභාවය අනුව විටමින් A අවශ්‍යතාවය වෙනස් වේ.
(4) ගර්භනී හා ක්ෂීරණ මව්වරුන් සඳහා යකඩ අවශ්‍යතාවය සමාන වේ.

10. ආහාර පිරමීඩයට අනුව අවම වශයෙන් ලබා ගත යුතු පළතුරු හා එළවළු ප්‍රමාණය අනුපිළිවෙළින් දක්වන්න.
(1) 1 – 3 හා 2 – 5 (2) 2 – 3 හා 3 – 5 (3) 6 – 11 හා 3 – 5 (4) 2 – 3 හා 3 – 4



Scanned with CamScanner

11. පහත දැක්වෙන රෝග ලක්ෂණ පෙන්නුම් කරනුයේ කුමන විටමිනය ඌනවීමෙන් ද?
* කෑම අරුචිය
* බෙරි බෙරියා රෝගය
* හෘදය ස්පන්දනය වැඩිවීම
* පේෂි දුර්වල වීම

(1) නයසින් (2) පිරිඩොක්සින් (3) තයමින් (4) රයිබෝෆ්ලේවින්

12. ආහාරයේ සුවඳ, රසය, පෙනුම වැනි සාධක නිසා ජීර්ණ පද්ධතිය තුළ විවිධ ස්‍රාවය නිපදවීම උත්තේජනය කරයි. ආහාරවල ජීර්ණය කෙරෙහි බලපාන මෙම සාධක
(1) සානසික සාධක (2) රසායනික සාධක
(3) භෞතික සාධක (4) ඉහත සියල්ලම

13. මන්දපෝෂණයේ දී පෙන්නුම් කරන ක්ෂයවීම නැමති තත්ත්වය ලෙස හඳුන්වනුයේ,
(1) වයසට සරිලන උස හා බර නොමැති බවය.
(2) වයසට සරිලන උස නොමැති බවය.
(3) උසට සරිලන බර නොමැති වීම.
(4) වයසට සරිලන බර නොමැති බවය.

14. පිසීමේ ක්‍රම පිළිබඳ නිවැරදි වගන්තිය කුමක් ද?
(1) පීඩනයෙන් පිසීමේ දී උෂ්ණත්වය $100^0C$ කි.
(2) ස්ටූ කිරීමේ දී අඩු උෂ්ණත්වයක් හා කෙටි කාලයක් ගත වේ.
(3) තැම්බීම තෙත් තාපයෙන් පිසීමේ ක්‍රමයක් වේ.
(4) බැදීම වියළි තාපයේ පිසීමේ ක්‍රමයකි.

15. ආහාර සකස් කිරීමේ දී ශිෂ්‍යාවන් අනුගමනය කළ යුතු පුරුදු කිපයක් පහත දැක්වේ.
A. මාළු ඇඹුල් තියල් සෑදීමේ දී මැටි ඇතිලියක් භාවිතා කිරීම.
B. පිසීම සඳහා එළවළු ඉතා කුඩා කැබලිවලට කැපීම.
C. ආහාර අනුභවයට ආසන්නව අමු සලාද පිළියෙල කිරීම.
D. පළා වර්ග හා එළවළු කපා සෝදා ගැනීම.
E. පිසීමෙන් පසු දෙහි ඇඹුල් දැමීම.

මින් හොඳ පුරුදු වන්නේ,

(1) A, B හා D ය. (2) A, B හා C ය. (3) A, C හා E ය. (4) ඉහත සියල්ලම

16. පරිරක්ෂිත ආහාරයක් ලෙස ලුණු දෙහි දැමීමේ දී සිදුවන ක්‍රියාවලිය වනුයේ,
(1) බාහිර ආශ්‍රැතිය මගින් ක්ෂුද්‍රජීවී වර්ධනයට අහිතකර තත්ත්වයක් ඇති කිරීම.
(2) දෙහිවල ඇති එන්සයිම අක්‍රිය වීම.
(3) ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය ඇති වීම.
(4) මාධ්‍යයේ සාන්ද්‍රණය වැඩි වීම.

17. අපරදිග විධිමත් ක්‍රමයට ආහාර පිළිගැන්වීමේ දී,
(1) පිඟානට වම්පසින් පළතුරු හැන්ද හා ගෑරුප්පුව තැබීම.
(2) පිඟානට ඉදිරියෙන් අත්පිස්නාව හා අතසෝදන කෝප්පය තැබීම.
(3) වතුර වීදුරුව පිඟානට වම් පසින් තැබීම.
(4) පිඟානට වම් පසින් ගෑරුප්පුව ද දකුණු පසින් පිහිය හා හැන්ද ද තැබීම.

18. පහත සඳහන් කරුණු අතරින් ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ නිවැරදි කරුණ කුමක් ද?
(1) එක් මසක් තුළ ඩිම්බ කෝෂ දෙකම පරිණත ඩිම්බය බැගින් මුදා හැරීම.
(2) කලලය ගර්භාෂය තුළ අධිරෝපණය වීම සිදුවේ.
(3) ආර්තවය ආරම්භ වනුයේ ඩිම්බ මෝචනය හා සමඟ ය.
(4) පැලෝපීය නාලවල කෘත්‍යය වනුයේ පරිණත ඩිම්බ රඳවා තබා ගැනීමයි.



Scanned with CamScanner

19. ගර්භනී සායනයක දී මව එක්වතාවක් පමණක් පරීක්ෂාවට ලක් කරනුයේ,
(1) රුධිරයේ සීනි මට්ටම ය.
(2) මුත්‍රා ය.
(3) උස ය.
(4) බර ය.

20. ඒ ඒ වයසට අනුව සමාජයේ අනුමත හැසිරීම් රටාවලට අනුගත වීමේ නොහැකියාව.
(1) දුස්සමාහිත බව (2) ක්ලමතය (3) මමත්වය (4) ආතතිය

21. නවජ දරුවා පෙන්වන ප්‍රතික ක්‍රියා ඇතුළත් වරණය වන්නේ,
(1) ශබ්ද කිරීම හා තිගැස්සීම.
(2) කිරි උරා බීම හා තිගැස්සීම.
(3) ස්පර්ශය හා ආලෝකයේ දී ඇස් වැසීම.
(4) තිගැස්සීම හා ස්පර්ශය.

22. නව යෞවන අවධියෙහි පසුවන්නකු මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්ෂණයකි.
(1) නායකත්වය දැරීමට ඇති හැකියාව
(2) කැපී පෙනීමට උත්සාහ කිරීම.
(3) ස්වීයත්වය ගොඩ නඟා ගැනීම.
(4) ආත්මඅභිමානය විදහා දැක්වීම.

23. ජපනිස් එන්සෙප ලයිටීස් (JE) එන්නත ළදරුවාට දෙනු ලබන වයස මාස,
(1) 4 සම්පූර්ණ වූ විටය.
(2) 6 සම්පූර්ණ වූ විටය.
(3) 9 සම්පූර්ණ වූ විටය.
(4) 12 සම්පූර්ණ වූ විටය.

24. පහත සඳහන්ව ඇත්තේ ළදරු වියේ දී ළමුන් විසින් සිදු කෙරෙන ක්‍රියාකාරකම් කිපයකි.
A. මුනින් අතට සිටින විට අත් දෙක තබා පපුව ඔසවයි.
B. උදව් නැතිව තනිව වාඩි වේ.
C. මැටි වලින් (ක්ලේ වලින්) සතුන් නිර්මාණය කරයි.
D. එක් අතකින් අනිත් අතට යම් යම් දේ මාරු කරයි.

මේ අතරින් ළදරු වියේ දරුවන්ගේ චාලක වර්ධනයට හේතුවන ක්‍රියාකාරකම් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A, C හා D ය. (2) A, B හා C ය. (3) B, C හා D ය. (4) A, B හා D ය.

25. කාන්තාවන්ගේ ආර්තවහරණය (ආර්තවය නැවතීම) සිදුවන සීමාව වනුයේ,
(1) අවු. 40 – 60 (2) අවු. 40 – 55 (3) අවු. 45 – 55 (4) අවු. 45 – 60

26. පළමු වසර තුළ ළදරුවකුගේ සංවර්ධනය පිළිබඳ වෛද්‍ය උපදෙස් ලබා ගත යුතු අවස්ථාවකි.
(1) අවට ශබ්ද කෙරෙහි අවධානය නොමැති වීම.
(2) අවුරුද්ද වන විට තනිව සිට ගැනීමට නොහැකි වීම.
(3) ආගන්තුකයින් දුටු විට බිය වීම.
(4) මාස 8 දී තනිව වාඩි වීමට නොහැකි වීම.

27. MMR එන්නත ලබා දෙන කාලසීමාවන් දෙක වනුයේ,
(1) මාස 12 හා අවු: 3
(2) මාස 09 හා අවු: 5
(3) මාස 18 හා අවු: 12
(4) මාස 12 හා අවු: 15

28. A නැමති මැහුම් ක්‍රමය වමේ සිට දකුණට මසන අතර රේඛා මැසීමට මෝස්තරයක සීමා රේඛා මැසීමට හැඩතල පිරවීමට යොදා ගනී. A වනුයේ,
(1) දම්වැල් මැස්ම (2) නැටි මැස්ම (3) කතිර මැස්ම (4) බලැන්කට මැස්ම

29. ටෙරලින් යනු,
(1) කෘතිම පොලිටයිඩ කෙන්දකි.
(2) අර්ධ කෘතිම කෙන්දකි.
(3) ඇක්‍රිලික් කෙන්දකි.
(4) කෘතිම පොලිඑස්ටර් කෙන්දකි.



Scanned with CamScanner

30. ශිල්පීය මැහුම් ක්‍රම පමණක් ඇතුළත් කාණ්ඩය වනුයේ,

(1) නූල් ඇදීම, වාටි මැස්ම (2) සැනගාංචු ඇල්ලීම, සන්නාලි වාටි මැස්ම

(3) පයිපින් කිරීම, බයින්ඩින් කිරීම. (4) සැටින් මැස්ම, දිගකොට මැස්ම

31. විවර පියවීමේ ක්‍රමයක් නොවන්නේ,

(1) දෙපෙති ජන්තු (2) සැනගාංචු (3) ටේප් ඇල්ලීම (4) පයිපිං කිරීම

32. ළමා ගවුමේ කඳ කොටස සඳහා පෝරුවක් යෙදීමෙන් අපේක්ෂා කෙරෙනුයේ,

(1) ශක්තිමත් බවක් ලබා දීමට. (2) ඇඳුමේ අද්දර නිම කිරීමට පහසු වීමට ය.

(3) විසිතුරු කිරීමේ පහසුවට ය. (4) පිරිසිදුව භාවිතා කළ හැකි වීම.

33. ළමා ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණක් නොවන්නේ,

(1) සේදීමට ඔරොත්තු දීම. (2) සැහැල්ලු හා විවිධ වර්ග වලින් යුතු වීම.

(3) කුඩා මෝස්තර සහිත වීම. (4) වටිනාකමෙන් අඩු වීම.

34. මැහුම් ක්‍රම වෙනස් වන නමුත් මැස්මේ සමානතාවයක් පෙන්නුම් කරන විසිතුරු මැහුම් ක්‍රම දෙක වනුයේ,

(1) බුලියන් මැස්ම හා බලැන්කට් මැස්ම (2) ප්‍රංශ ගැට මැස්ම හා බුලියන් මැස්ම

(3) කතිර මැස්ම හා බලැන්කට් මැස්ම (4) ප්‍රංශ ගැට මැස්ම හා කතිර මැස්ම

35. ළදරු ඇඳුම මැසීම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත. මින් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) උරහිස මැසීමේ දී ප්‍රංශ මූට්ටුව යෙදිය හැකිය.

(2) වාටිය මැසීමේ දී සිහින්ව නවා වාටි මැස්ම යොදයි.

(3) අලංකාර කිරීම සඳහා බුලියන් මැස්ම යොදයි.

(4) අත්කට මැසීමේ දී අත්කට වටා වාටි මැස්ම යොදා කිහිල්ලට බලැන්කට් මැස්ම යොදයි.

36. නිර්මාණයකින් ඉටු විය යුතු කාර්යය නිසි පරිදි ඉටුවන සේ සැකසී තිබීම.

(1) නිර්මාණශීලී බවයි. (2) සජීවී බවයි. (3) ක්‍රියානුරූපී බවයි. (4) ක්‍රියාශීලී බවයි.

37. ගෘහීය අය වැය ලේඛනයක ඇතුළත් අත්‍යාවශ්‍ය වියදම් 2 ක් වනුයේ,

(1) උත්සව සහ නිවාස ය. (2) ගමනාගමනය සහ චාරිකා ය.

(3) අධ්‍යාපනය සහ විනෝද ය. (4) ඇඳුම් පැළඳුම් සහ ආහාර ය.

38. කිසියම් කාර්යයක් කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා කළමනාකරණය කිරීමේ අනුපිළිවෙළ වනුයේ,

(1) ඇගයීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය

(2) ක්‍රියාත්මක කිරීම, සංවිධානය, සැලසුම් කිරීම හා ඇගයීමය.

(3) සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීමය.

(4) සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා සංවිධානය.

39. නිවෙස් කීපයක දක්නට ලැබුණු ලක්ෂණ සමහරක් පහත දැක්වේ. මින් යෝග්‍ය නොවන ලක්ෂණය කුමක් ද?

(1) ජනේලවලට ඉහළින් වා කවුළු තිබීම.

(2) නිදන කාමරයට යාබදව නාන කාමරය හා වැසිකිළිය තිබීම.

(3) මුළුතැන්ගෙයට දොර දෙකක් තිබීම.

(4) නිදන කාමරයක ජනේල සඳහා පාරදෘශ්‍ය වීදුරු යොදා තිබීම.

40. මෝස්තර මූලධර්මයක් වන රිද්මය පෙන්නුම් කරන අවස්ථාවකි.

(1) නිවසක ඇති තරප්පු පේළිය

(2) සිවිලිමෙහි මැදට සවිකර ඇති විදුලි පහන

(3) කෑම මේසය මැද ඇති මල් සැකසුම

(4) විසිත්ත කාමරයෙහි තබා ඇති විවිධ උපාංග

*****



Scanned with CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

1572

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව - II | 85 | S | II | කාලය: පැය 02 යි. |
|---|---|---|---|---|---|

සැලකිය යුතුයි :

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1). අනුර හා මනෝරි තරුණ අඹු සැමි යුවළකි. අනුර විධායක ශ්‍රේණියේ නිලධාරියෙක් වන අතර, මනෝරි නිවසේ වැඩ කටයුතු වල නියැලෙන්නීය. මොවුන්ට අවුරුදු 3 ක් වයසැති දියණියක් සිටියි. මෙම යුවළ තම පවුලේ පෝෂණය, දරුවා රැක බලා ගැනීම, පවුලට අවශ්‍ය ඇඳුම් නිර්මාණය, නිවසෙහි සහ ගෙවත්තෙහි ප්‍රසන්න බව යනා දී කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරති.

(i) මෙම පවුල් වර්ගය හඳුන්වන්න. එහි වාසි දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) අවුරුදු 3 ක් වයසැති දරුවාට අවශ්‍ය විශේෂ පෝෂණ අවශ්‍යතා 4 ක් ලියන්න. (ලකුණු 02)

(iii) පියාට රැගෙන යාමට සුදුසු දිවා ආහාර වේලක් සඳහා සුදුසු බොජුන්පතක් සැලසුම් කරන්න.(ලකුණු 02)

(iv) ඉහත සඳහන් කළ බොජුන්පත තෝරා ගැනීමට හේතු 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) දරුවාගේ ඇඳුම් අලංකරණය සඳහා භාවිතා කළ හැකි අත් සැරසිලි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(vi) දරුවා රැක බලා ගැනීමේ දී ඇයගේ සෞඛ්‍ය ආරක්ෂණය සඳහා දෙමාපියන් විසින් ගත යුතු පියවර හතරක් ලියන්න. (ලකුණු 02)

(vii) මැසීමේ කුසලතා උපයෝගී කර ගනිමින් නිර්මාණය කළ හැකි මුළුතැන්ගෙය සඳහා ප්‍රයෝජනවත් හා අලංකරණය ගෙන දෙන උපාංගයක් නම් කරන්න. ඒ සඳහා දළ සැලැස්ම අඳින්න. (ලකුණු 02)

(viii) මෙම දරුවාගේ මානසික වර්ධනය සඳහා ක්‍රීඩා භාණ්ඩ තේරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ix) සමහර අවස්ථාවල දියණිය චිත්තවේග අසමතුලිතතාවයක් දක්වයි. මෙයට හේතු විය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(x) ගෙවත්තෙහි ප්‍රසන්න බව ඇති කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වන්න. (ලකුණු 02)

(2). (i) මැසීමේ ශිල්පීය ක්‍රම 3 ක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 03)

(ii) (a) කුෂන් කවරයේ විවර පියවීමේ ක්‍රම 2 ක් ලියන්න. (ලකුණු 1½)

(b) තිරස් බොත්තම් කාසය මසා ගන්නා ආකාරය රූප සටහනකින් පහදන්න. (ලකුණු 1½)

(iii) ළමා ගවුමෙහි සාය කොටස කඳට ඇල්ලීම සඳහා අනුගමනය කරන පියවර ලියන්න. (ලකුණු 04)

(3). (i) අග්න්‍යාශයෙන් ස්‍රාවය කරන එන්සයිම වර්ග 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මහළු වියෙහි පසුවන්නකු රාත්‍රී ආහාර සඳහා සුදුසු ආහාර වර්ග 2 ක් නම් කර එම ආහාර පිසීමේ ක්‍රමය හා තාප සංක්‍රමණ ක්‍රමය ලියන්න. (ලකුණු 04)

(iii) අවු: 75 ක කාන්තාවකගේ ආහාර වේල සකස් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු 3 ක් පහදන්න. (ලකුණු 03)



Scanned with CamScanner

(4). (i) ආහාර නරක් වීමට බලපාන භෞතික හේතු 3 ක් සඳහන් කර ඒවා මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් ලියන්න. (ලකුණු 03)

(ii) "කැරටොමැලේෂියා" තත්ත්වය පහදන්න. (ලකුණු 03)

(iii) ආහාර පරිභෝජන රටාව මෙන්ම ජීවන රටාව ද පුද්ගලයකුගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපායි. කරුණු 4 ක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 04)

(5). (i) කිසියම් වර්ණයක දීප්තිමත් බව අඩු කිරීම සඳහා කළ යුතු දේ උදාහරණ 2 ක් ඇසුරින් දක්වන්න. (ලකුණු 03)

(ii) තුලනය මෝස්තර මූලධර්මයකි. කාමරයක් තුළ විධිමත් තුලනය ඉදිරිපත් කළ හැකි අයුරු රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) මානව සම්පත් ගෘහ අභිවෘද්ධිය සඳහා යොදා ගන්නා ආකාරය පහදන්න. (ලකුණු 03)

(6). (i) ගැබිණි මවට දෙවන හා තෙවන ත්‍රෛමාසික වල දෛනිකව වැඩිපුර අවශ්‍ය වන පෝෂක මොනවාද? (ලකුණු 03)

(ii) (a) මව්කිරි ලබා දීම තුළින් මවට සැලසෙන වාසි 2 ක් ලියන්න. (ලකුණු 02)

(b) දරුවා තුළින් පිළිබිඹු කරන හැකියා වර්ධනය කිරීමට ගත හැකි පියවර 2 ක් දක්වන්න. (ලකුණු 02)

(iii) දරුවාගේ සාමාජීය වර්ධනය සඳහා මවට කළ හැකි කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(7). (i) යහපත් ප්‍රජනන සෞඛ්‍ය පුරුදු 3 ක් ලියන්න. (ලකුණු 03)

(ii) නව යොවුන් වියේ දැරියක ගර්භනීභාවයට පත් වුවහොත් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) යොවුන් වියේ පසුවන දරුවන්හට උපදේශනයේ වැදගත්කම පහදන්න. (ලකුණු 04)

****



Scanned with CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව - I | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 1 | 11. 3 | 21. 1 | 31. 4 |
| 02. 3 | 12. 1 | 22. 4 | 32. 1 |
| 03. 4 | 13. 4 | 23. 3 | 33. 4 |
| 04. 1 | 14. 3 | 24. 4 | 34. 2 |
| 05. 2 | 15. 3 | 25. 3 | 35. 1 |
| 06. 3 | 16. 1 | 26. 1 | 36. 3 |
| 07. 2 | 17. 4 | 27. 1 | 37. 4 |
| 08. 3 | 18. 2 | 28. 2 | 38. 3 |
| 09. 4 | 19. 3 | 29. 4 | 39. 4 |
| 10. 2 | 20. 1 | 30. 3 | 40. 1 |